**දක්ෂිණ අධිවේගී මාර්ග ව්‍යාපෘතිය මානව භූ දර්ශනය කෙරෙහි සිදු කරන බලපෑම**

**ටී. ඒ. ලසන්ති සහ පින්නවල සංඝසුමන හිමි**
**භූගෝල විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**
***lasa.jaya85@gmail.com***

ශ්‍රී ලංකාවේ මාර්ග සංවර්ධන ක්ෂේත්‍රයේ සුවිශේෂී සංධිස්ථානයක් සනිටුහන් කරන නවමු සංවර්ධන ප්‍රවේශයක් ලෙස අධිවේගී මාර්ග ව්‍යාපෘති වත්මන් ජාතික සංවර්ධනය තුළ කැපී පෙනේ. අනාගත සංවර්ධන ඉලක්ක රැසක් සපුරාගනුවස් දියත්කර ඇති දැවැන්ත අධිවේගී මාර්ග ව්‍යාපෘති අතර දක්ෂිණ අධිවේගී මාර්ගය දිගින් වැඩි වූ ද පළමුවෙන් ම ජාතික මාර්ග පද්ධතියට එක්වන්නාවූ ද මාර්ගය වශයෙන් ඉතා වැදගත්වේ. ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක තුනකට අයත් විශාල භූමි ප්‍රමාණයක් ආවරණය කරනු ලබන මෙම මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය මානව භූ දර්ශනය කෙරෙහි සිදුකර ඇති සාධනීය හා ප්‍රතිෂේධක බලපෑම් විග්‍රහ කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වේ. එය යටතේ ග්‍රාමීය ප්‍රජාවගේ ආර්ථික ක්‍රියාවලිය කෙරෙහි මෙම ව්‍යාපෘතිය බලපාන ලද්දේ කවර ලෙසකින්ද යන්නත් එම බලපෑම සමාජ හා සංස්කෘතික අවකාශයේ කුමන වෙනස්වීම් සිදු කර තිබේද යන්නත් අධ්‍යයනය කිරීම අවශේෂ අරමුණු අතර වේ. මෙම මාර්ග ව්‍යාපෘතිය ක්‍රියාත්මකවීමේ දී ග්‍රාමීය ප්‍රජාව කෙරෙහි ඇති කරන ලද බලපෑම පිළිබඳව වඩාත් අවධානය යොමු කරන ලදි. අධ්‍යයනයේ නියැදිය වශයෙන් තෝරාගනු ලැබුවේ කළුතර දිස්ත්‍රික්කයේ දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් බලපෑමට ලක් වූ ගම් තුනකි. ප්‍රමාණාත්මක හා ගුණාත්මක ප්‍රවේශයන් ඒකාබද්ධ වූ ක්‍රමවේදයක් අධ්‍යයනයේ දී භාවිතයට ගන්නා ලදි. අධිවේගී මාර්ගය හේතුවෙන් ප්‍රදේශයේ මානව භූ දර්ශනයට සිදු වූ බලපෑම විග්‍රහ කිරීමේ දී සරල සංඛ්‍යාන ශිල්පීය ක්‍රමද, සිතියම් විද්‍යාත්මක ශිල්පීය ක්‍රමද, ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමද භාවිතයට ගනු ලැබීය.

මෙම අධ්‍යයනය මගින් හෙළි වූ වැදගත් කරුණු කිහිපයකි. එනම්, අධිවේගී මාර්ග ව්‍යාපෘතිය නිසා ප්‍රදේශයේ ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි යහපත් බලපෑමක් සිදු වී ඇති අතර එය තාවකාලික එකකි. දිගුකාලීනව පවත්වාගෙන ආ ප්‍රධාන හා ද්විතීයික ආදායම් මාර්ග බිඳ වැටීම හේතුවෙන් ග්‍රාමීය ගෘහ ආර්ථිකය කෙරෙහි මෙම ව්‍යාපෘතිය අහිතකර ලෙස බලපා ඇත. තල්ලු කිරීමේ සහ ඇද ගැනීමේ සාධක රාශියක් හේතුවෙන් ප්‍රතිස්ථාපිත ජනතාවගේ ආර්ථික කටයුතු පෙරට වඩා වෙනස්වෙමින් පවතී. මෙම ව්‍යාපෘතිය මගින් පාරිසරික වශයෙන් සිදු වී ඇති අහිතකර බලපෑම් දිගුකාලීනව බොහෝ අර්බුද මතු කරන බවට දැනටමත් පෙර ලකුණු පහළවී තිබේ. සැලකිය යුතු වන්දියක් ලැබීම, අධිවේගී මාර්ගය නිසා ප්‍රදේශය ක්‍රමයෙන් ජනාකීර්ණ වීම, ඉඩම් මිළ ඉහළ යාම, යටිතල පහසුකම් සංවර්ධනය වීම ආදී සාධනීය වෙනස්කම් ද දක්ෂිණ අධිවේගී මාර්ගය නිසා ඇති වී තිබෙන බව අධ්‍යයනය මගින් තහවුරු වේ. අධිවේගී මාර්ග ව්‍යාපෘතිය මගින් උද්ගත වූ නව තත්ත්වයන් එනම් වන්දි මුදල් විවිධ මට්ටමින් ලැබීම, එකිනෙකා පරයා ව්‍යාපෘතියෙන් ප්‍රතිලාභ ලබා ගැනීමේ තරගයක් ඇතිවීම ආදී කරුණු සමාජ විසංඝටනය කෙරෙහි බලපා තිබේ.

***ප්‍රමුඛ පද :*** *මාර්ග ව්‍යාපෘති, මානව භූ දර්ශනය, ග්‍රාමීය ප්‍රජාව, සමාජාර්ථික බලපෑම*